

# GSP Plus වැඩසටහන සහ ශ්‍රී ලංකාවේ මානව හා කම්කරු අයිතිවාසිකම්

2019 අගෝස්තු

DEMOCRACY
REPORTING
INTERNATIONAL



# වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP)

GSP යනු ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ඕස්ට්‍රේලියාව, නෝර්වේ වැනි සංවර්ධිත රටවල් විසින් ක්‍රියාත්මක කරන ලද වෙළඳ විධික්‍රමයයි. එමගින් සංවර්ධනය වෙමින් පවතින රටවලට තීරු බදු අඩුවෙන් හෝ තීරු බදු රහිතව තම භාණ්ඩ අපනයනය කිරීමට අවස්ථාව ලබා දෙයි. 1970 දශකයේ සිට ශ්‍රී ලංකාව GSP වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබමින් සිටියි. සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාවය අවම කිරීමට, යහපාලනය වැඩි දියුණු කිරීමට සහ තිරසාර සංවර්ධන ක්‍රියාවලියක් ඇති කිරීමට යුරෝපා සංගමය (EU) විසින් මෙම යෝජනා ක්‍රමය සපයා ඇත.

# EU හි GSP Plus වැඩසටහන යනු කුමක්ද?

2005 දී, යුරෝපා සංගමයේ GSP වැඩසටහන යටතේ "GSP Plus" සහ ආයුධ හැර අනෙකුත් සියල්ල සඳහා වන බදු සහනය (EBA) ලෙස හඳුන්වන විශේෂ දිරිගැන්වීමේ ගිවිසුම් යුරෝපා සංගමය විසින් හඳුන්වා දෙන ලදී. ආයුධ හැර සියල්ල සඳහා වන බදු සහනය යටතේ රටවල් 49 කට ආයුධ සහ පතොරම් හැර ඕනෑම නිෂ්පාදනයක් තීරුබදු රහිතව සහ කෝටා රහිතව ලබාගැනීමේ පහසුකම ලැබේ. GSP Plus වැඩසටහන 2005 දී යුරෝපා සංගමය විසින් හඳුන්වා දෙන ලදී. යුරෝපා සංගමයේ GSP වැඩසටහන යටතේ තෝරාගත් නිෂ්පාදන ලැයිස්තුවක් GSP Plus සහනය ලද රටවල් වලින් යුරෝපා සංගමයට අපනයනය කළ හැකි අතර, එම සහනය ලද රටවල් අපනයනය කරනු ලබන නිෂ්පාදන ආනයන බද්දෙන් නිදහස් කරනු ලැබේ. ශ්‍රී ලංකාව, ආර්මේනියාව, බොලිවියාව, කේප් වර්ඩ්, කිර්ගිස්තානය, මොන්ගෝලියාව, පාකිස්තානය සහ පිලිපීනය ඇතුළු රටවල් අටක් දැනට මෙම GSP Plus වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා ඇත.

# GSP PLUS සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම්

- ලෝක බැංකුව විසින් ඉහළ මැදි ආදායම් ආර්ථික මට්ටමට වඩා පහලින් පැවතින රටක් ලෙස ගණනය කර තිබිය යුතුයි.
- යුරෝපීය වෙළඳපොළට ප්‍රවේශය ලබා දෙන වෙනත් ගිවිසුමකින් (නිදහස් වෙළඳ ගිවිසුමක් වැනි) ප්‍රතිලාභ ලබා නොගත යුතුයි.
- මානව හිමිකම්, කම්කරු අයිතිවාසිකම්, පරිසර සංරක්ෂණය හා යහපාලනයට අදාළ ප්‍රඥප්ති 27 ක් අනුමත කිරීම සහ මෙම ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට කොමිසම සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

# GSP Plus සඳහා අයදුම් කිරීම

GSP Plus ලබා ගැනීම සඳහා ඊට උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් රටවල් යුරෝපා සංගමයට අයදුම් කළ යුතුය. අයදුම්පතක් ඉදිරිපත් කළ පසු, ඇගයීමක් පවත්වනු ලබන අතර එයට ආසන්න වශයෙන් මාස දහයක් ගතවේ.

අයදුම්පත පරීක්ෂා කිරීමට යුරෝපා කොමිසමට මාස හයක් ගත වන අතර නිසි අවශ්‍යතා සපුරාලන්නේ නම් GSP + ලබා දීමට මනාප බව යෝජනා කරයි. ඉන් පසු, යුරෝපා සංගමයේ කවුන්සිලයට සහ යුරෝපීය පාර්ලිමේන්තුවට කොමිසම ඉදිරිපත්කළ යෝජනාව සලකා බලා තීරණයක් ගැනීමට මාස දෙකක් පමණ ගත වේ.



## අධීක්ෂණය

ප්‍රඥප්ති 27 අනුමත කිරීම ම පමණක් ප්‍රමාණවත් නොවේ. සහනය ලබන රටවල් මෙම ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීමට හා ඒවාට අනුකූල විය යුතු වේ. සහනය ලබන රටවල් විසින් මෙම ප්‍රඥප්ති 27 ක්‍රියාත්මක කරන ආකාරය අධීක්ෂණය කරන ක්‍රියාවලියක් යුරෝපා සංගමයට ඇත. එම අධීක්ෂණය තොරතුරු හුවමාරුව, සංවාදය සහ චාරිකා වලින් සමන්විත වන අතර සිවිල් සමාජ කණ්ඩායම්, වෙළඳ සංගම් සහ වෙනත් අය ඇතුළු විවිධාකරයේ පාර්ශ්වකරුවන් ද මෙයට සම්බන්ධ වේ. GPS Plus සහනය අයදුම්කරුට ලබා දුන් පසු, යුරෝපා කොමිසම සෑම වසර දෙකකට වරක්ම ප්‍රඥප්ති 27 ට අදාළව සහනය ලබන රටවල අනුකූලතාවය සහ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ප්‍රකාශයට පත් කරයි.

## GSP Plus සහ ශ්‍රී ලංකාව

2005 සිට ශ්‍රී ලංකාව GSP Plus ප්‍රතිලාභියෙකු ලෙස කටයුතු කර ඇත. කෙසේ වෙතත්, 2009 දෙසැම්බරයේදී, ප්‍රඥප්ති තුනකට අනුකූල නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවට GSP Plus සහන ලබා දීම තාවකාලිකව නතර කිරීමට යුරෝපා සංගමය විසින් තීරණය කරන ලදී. එම ප්‍රඥප්ති නම්, ළමා අයිතිවාසිකම් පිළිබඳ වන ප්‍රඥප්තිය, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ වධහිංසාවට එරෙහි සම්මුතිය යි. 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට GSP Plus සහනය නැවත ලබා දෙන ලදි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ මරණීය දණ්ඩනය නැවත හඳුන්වා දීම පිළිබඳව සිදුකරන නව සාකච්ඡා හේතුවෙන් යුරෝපා සංගමය අනතුරු අඟවා ඇත්තේ මෙම තත්වයන් යටතේ ශ්‍රී ලංකාවට GSP Plus සහන අහිමිවිය හැකි බවයි.

# ශ්‍රී ලංකා ආර්ථිකයට GSP + හි බලපෑම

මෙම වැඩසටහන යටතේ, තීරුබදු රහිතව නිෂ්පාදන 6,000 කට වැඩි ප්‍රමාණයක් යුරෝපා සංගම් වෙළඳපොළට අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි වේ.

2017 මැයි මාසයේදී සහනය නැවත ප්‍රදානය කරන තෙක්, එය නැවැත්වූ කාල සීමාවේදී ශ්‍රී ලංකාවට රුපියල් බිලියන 150-250 පමණ අපනයන ආදායමක් අහිමි විය. මීට අමතරව, ශ්‍රී ලංකාව බිලියන 55 ක (රුපියල් මිලියන 9.625) විදේශීය ණය උගුලක සිටින බව කියනු ලැබේ. වෙනත් වචන වලින් කිවහොත්, සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන්ම රු. 437,500 ක ණය මුදලක් විදේශීය ණය ලබා දෙන්නන්ට හිමි විය යුතුයි. 2019 පෙබරවාරි 04 වන දින වන විට, ප්‍රධාන විදේශීය ණය දෙන්නන් අතරට චීනය (14%), ආසියානු සංවර්ධන බැංකුව (14%), ජපානය (12%) සහ ලෝක බැංකුව (11%) ඇතුළත් වේ.

2017 මැයි මාසයේ සිට GSP Plus නැවත ලබා දීමෙන් පසුව, යුරෝපා සංගම් රටවලට කරන අපනයන මාස 24ක් තුළ 11% කින් ඉහළ ගොස් තිබේ.

යුරෝපා සංගමයට කරන අපනයනයෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් ඇඟලුම් නිෂ්පාදන වුවද එය සාම්ප්‍රදායික නොවන අපනයන හා සසඳන විට වර්ධනය වී ඇත්තේ 8% කින් පමණි. වැඩිවන මාසික විදේශ ණය වාරික ආපසු ගෙවීමට විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාව ඉතා දුෂ්කර තත්ත්වයකට පත්ව ඇත. විදේශ ණය ආපසු ගෙවීම් පියවා ගැනීම සඳහා තවදුරටත් ණය ගැනීමට රටට බලපෑමක් එල්ල කර ඇත. වැඩිවන විදේශ ණය ආපසු ගෙවීම් හේතුවෙන් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වන අතර එමගින් ආනයනය කරන ලද සියලුම අත්‍යවශ්‍ය නිෂ්පාදන වන ආහාර, ඛනිජ තෙල්, වෛද්‍ය, ඖෂධ ආදියෙහි මිල ඉහළ ගියේය.



# GSP + වැඩසටහන යටතේ සුදුසුකම් ලැබීම සඳහා සහන ලබන රාජ්‍යයන් සපුරාලිය යුතු ජාත්‍යන්තර ප්‍රඥප්ති ලැයිස්තුව

මූලික මානව හා කම්කරු අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ / ජාත්‍යන්තර කම්කරු සංවිධාන ප්‍රඥප්ති

1. වාර්ගික සංහාර අපරාධය වැලැක්වීම සහ ඒ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීම සඳහා වන ප්‍රඥප්තිය (1948)
2. සියලු ආකාරයේ වර්ගවාදී වෙනස්කම් පිටුදැකීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1965)
3. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966)
4. ආර්ථික, සමාජයීය, සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966)
5. කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් පිටුදැකීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1979)
6. වධහිංසාව සහ සෙසු කෘෘර, අමානුෂික, අවමන් සහගත සැලකීම්වලට එරෙහි ප්‍රඥප්තිය (1984)
7. ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (1989)
8. අනිවාර්ය ශ්‍රමය හෝ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම වැලැක්වීම පිළිබඳ ප්‍රඥප්තිය, අංක 29 (1930)

9. සමාගමයේ නිදහස සහ සංවිධානගතවීමේ නිදහස ආරක්ෂාකිරීම සඳහා වන ප්‍රඥප්තිය, අංක 87 (1948)

10. සංවිධානගතවීමේ නිදහස සහ සාමූහික වශයෙන් කේවල්කිරීමේ අයිතිය සම්බන්ධයෙන් අදාළවන මූලධර්ම සහතිකකිරීම සඳහා වන ප්‍රඥප්තිය, අංක 98 (1949)

11. සමාන වටිනාකම් සහිත ශ්‍රම සැපයීම් සඳහා ස්ත්‍රී -පුරුෂ දෙපාර්ශවයටම සමාන ප්‍රතිලාභ සහතික කිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය, අංක 100 (1951)

12. බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම වැලැක්වීමේ ප්‍රඥප්තිය, අංක 105 (1957)

13. රැකියාවන් සහ වෘත්තීය තත්ත්වයන් සම්බන්ධයෙන් පවතින වෙනස්කොට සැලකීම් පිටුදැකීම සම්බන්ධ ප්‍රඥප්තිය, අංක 111 (1958)

14. වෘත්තීය තත්ත්වයන්ට එළැඹීම සඳහා වන අවම වයස සම්බන්ධ ප්‍රඥප්තිය, අංක 138 (1973)

15. ළමා ශ්‍රමිකත්වයේ වඩාත්ම දරුණු මුහුණුවර වැලැක්වීමේ සහ ඒවා සම්බන්ධයෙන් ක්ෂණික පිළියම් යෙදීම සම්බන්ධ ප්‍රඥප්තිය, අංක 182 (1999)

16. අන්තරායන්ට මුහුණපා ඇති වනසත්ව හා ශාක විශේෂ ජාත්‍යන්තරව වෙළඳාම්කිරීම සම්බන්ධයෙන් වන ප්‍රඥප්තිය (1973)

17. ඕසෝන් ස්ථරයට හානි පමුණුවන ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වන මොන්ට්‍රියල් වෛකල්පිත සන්ධානය (1987)

18. අන්තර්-දේශසීමා අතර අන්තරායකර අපද්‍රව්‍ය එහා මෙහා ගෙනයාම සහ එවැනි අපද්‍රව්‍ය විනාශකිරීම පාලනයකිරීම සම්බන්ධයෙන් වන බේසල් සම්මුතිය (1989)

19. ජෛව විවිධත්වය සම්බන්ධයෙන් වන ප්‍රඥප්තිය (1992)

20. දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතිය (1992)

21. ජෛව ආරක්ෂාව සම්බන්ධයෙන් වන කාර්ටගන් වෛකල්පිත සන්ධානය (2000)

22. නොනැසෙන ස්වාභවයේ කාබනික පරිසර දූෂ්‍යකාරක සම්බන්ධයෙන්වන ස්ටොක්හෝම් සම්මුතිය (2001)

23. දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ මූලධර්ම සම්මුතියට එක්කරන ලද කියෝටෝ වෛකල්පිත සන්ධානය (1998)

24. මත්ද්‍රව්‍ය අගයන් සහිත ඖෂධ සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ඍජු ප්‍රඥප්තිය (1961)

25. මනෝව්‍යාධිකාරක අගයන් සහිත ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1971)

26. මත්ද්‍රව්‍යමය අගයන් සහිත ඖෂධ සහ මනෝව්‍යාධිකාරක අගයන් සහිත ද්‍රව්‍යයන් නීතියට පටහැනිව වෙළඳාම්කිරීම පිටැදැකීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1988)

27. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (2004)

# ILO (ජාත්‍යන්තර කම්කරු සංවිධානය) කම්කරු ප්‍රඥප්ති අට පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයක්

ජාත්‍යන්තර ශ්‍රම ප්‍රමිතීන් යනු ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සංඝටකයන් (රජයන්, සේවා යෝජකයින් සහ සේවකයන්) විසින් සකස් කරන ලද, සේවය කිරීමේ දී මූලික මූලධර්ම සහ අයිතිවාසිකම් නියම කරන නෛතික මෙවලම් වේ. ඒවා සාමාජික රටවල් විසින් අනුමත කළ හැකි ජාත්‍යන්තර ගිවිසුම් සමග නීත්‍යානුකූලව බැඳෙන ප්‍රඥප්ති විය හැකිය, නැතහොත් නොබැඳෙන මාර්ගෝපදේශ ලෙස සේවය කරන නිර්දේශ වේ. බොහෝ අවස්ථාවන්හීදී, අදාළ නිර්දේශයක් මගින් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මාර්ගෝපදේශ සපයමින් පරිපූරකයට අනුබල දෙමින්, රටවල් අනුමත කර ක්‍රියාත්මක කළ යුතු මූලික මූලධර්මයන් ප්‍රඥප්තියක් මගින් දක්වා ඇත. ඇතැම් විටක, නිර්දේශයන් කිසිදු ප්‍රඥප්තියකට සම්බන්ධ නොවී තනිවම පැවතිය හැකිය.

# අනිවාර්ය ශ්‍රමය හෝ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම වැලැක්වීම පිළිබඳ ප්‍රඥප්තිය, අංක 29 (1930)

මෙම ප්‍රඥප්තිය මගින් සියළුම ආකාරවලින් අනිවාර්ය ශ්‍රමය හෝ බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම මැඩපැවැත්වීමට සාමාජික රටවල් බැඳී සිටිති. ප්‍රඥප්තියේ ඇති ආකාරයට යම් පුද්ගලයෙක්ගෙන් එම පුද්ගලයාම ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් නොවූ යම් දඩුවමක් තර්ජනයක් යටතේ ලබාගත් සියලුම ආකරයේ වැඩක් හෝ සේවයක් බලහත්කාරයෙන් ලබා ගන්නා හෝ අනිවාර්ය ශ්‍රමය ලෙස නිර්වචනය කරයි. ප්‍රඥප්තියේ දක්වන ආකාරයට, බලහත්කාරයෙන් ලබා ගන්නා හෝ අනිවාර්ය ශ්‍රමය යටතට ගත හැක්කේ 18-45 අතර පුද්ගලයින් පමණක් වන අතර, එම පුද්ගලයා වැඩට සුදුසු යැයි නිසි වෛද්‍ය මතයක් තුළින් සහතික කිරීම, පාසල් ගුරුවරුන් සහ සිසුන් නිදහස් කිරීම්, සෑම ප්‍රජාවක්ම පවුල් හා සමාජ ජීවිතයට අත්‍යවශ්‍ය දැනුම් තේරුම් ඇති ශක්තිමත් පුරුෂයින් නඩත්තු කිරීම හා සංජානනීය හා පවුල් සබඳතාවලට ගරු කිරීම වැනි සීමාවන් සහ කොන්දේසි සම්පාදනය කරයි.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව විසින් 1950 අප්‍රේල් 05 දින අනුමත කරන ලදී.



# අදාළ අභ්‍යන්තර නීති

2015 දක්වා සංශෝධනය කරන ලද,1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන

1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (රැකියා හා පාරිශ්‍රමික රෙගුලාසි) පනත

2002 අංක 19 දරන කර්මාන්ත ශාලා (සංශෝධිත) පනත

1959 අංක 6 දරන සේවක නිවාඩු පනත

# සමාගමයේ නිදහස සහ සංවිධානගතවීමේ නිදහස ආරක්ෂාකිරීම සඳහා වන ප්‍රඥප්තිය, අංක 87 (1948)

මෙම ප්‍රඥප්තියට සේවා යෝජකයින්ට සහ කම්කරුවන්ට පූර්ව අවසරයකින් තොරව තමන් කැමති සංවිධානවලට බැඳීමට ඇති අයිතිය, නීති රීති හා ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ සංවිධානවලට ඇති අයිතිය, නිලධාරීන්ට ඡන්දය දීම සහ රාජ්‍ය බලධාරීන්ගේ මැදිහත්වීමකින් තොරව පරිපාලන කටයුතු සංවිධානය කිරීම යන කරුණු ඇතුළත් වේ.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 1995 සැප්තැම්බර් 15 වන දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.

# අදාළ අභ්‍යන්තර නීති

2015 දක්වා සංශෝධනය කරන ලද,1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1935 වෘත්තීය සමිති ආඥා පනත

1950 කාර්මික ආරවුල් පනත සහ එහි සංශෝධන

2003 අංක 13 දරන කාර්මික ආරවුල් (නඩු විභාග කිරීම සහ තීරණය කිරීම) (විශේෂ විධිවිධාන) පනත

1995 අංක 11 දරන බේරුම්කරණ පනත

1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත සහ එහි සංශෝධන

1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත සහ එහි සංශෝධන

1935 වෘත්තීය සමිති රෙගුලාසි

1970 අංක 25 දරන වෘත්තීය සමිති නියෝජිතයින් (වතු වලට ඇතුළුවීමේ) පනත

# සංවිධානගතවීමේ නිදහස සහ සාමුහික වශයෙන් කේවල්කිරීමේ අයිතිය සම්බන්ධයෙන් අදාළවන මූලධර්ම සහතිකකිරීම සඳහා වන ප්‍රඥප්තිය, අංක 98 (1949)

මෙම ප්‍රඥප්තිය මගින් සේවා යෝජකයන්ගේ මැදිහත්වීමකින් තොරව වෘත්තීය සමිති සාමාජිකයින්ට ස්වාධීනව සංවිධානය වීමේ අයිතිය ලබා දේ. 1 වන වගන්තිය මගින්, සේවා යෝජකයන් විසින් වෘත්තීය සමිතිවලට බැඳීමට එරෙහිව පනවා ඇති කොන්දේසි, සේවයෙන් පහ කිරීම හෝ වෘත්තීය සමිතිවලට සම්බන්ධ වීම හෝ වෘත්තීය සමිති ක්‍රියාකාරකම්වල යෙදීම සම්බන්ධයෙන් ඇති බාධා වැනි වෘත්තීය සමිතියකට බැඳීම සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීමට එරෙහිව කම්කරුවන් ආරක්ෂා කළ යුතුය. එය "මූල්‍ය හෝ වෙනත් මාර්ග" හරහා සේවා යෝජකයන් විසින් ආධිපත්‍යය දැරීම වළක්වයි. සාමූහික කේවල් කිරීම සම්බන්ධයෙන් ගත් කළ, ප්‍රඥප්තියට අවශ්‍ය වන්නේ සාමූහික කේවල් කිරීම මගින් රැකියා නියම හා කොන්දේසි විධිමත් කිරීමට සේවක සංවිධාන සහ සේවා යෝජක කණ්ඩායම් අතර ස්වේච්ඡා සාකච්ඡා සඳහා කාර්යසංවිධානයේ පූර්ණ සංවර්ධනය හා භාවිතය නීතියෙන් ප්‍රවර්ධනය කිරීමයි.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 1972 දෙසැම්බර් 13 වන දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.

## අදාළ අභ්‍යන්තර නීති

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1978 ව්‍යවස්ථාව (2000 දක්වා සංශෝධිත පරිදි)

1935 වෘත්තීය සමිති ආඥා පනත

1950 කාර්මික ආරවුල් පනත සහ එහි සංශෝධන

## සමාන වටිනාකම් සහිත ශ්‍රම සැපයීම් සඳහා ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයටම සමාන ප්‍රතිලාභ සහතිකකිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය, අංක 100 (1951)

මෙම ප්‍රඥප්තියට අනුව සාමාජික රටවල පුරුෂයින්ට හා කාන්තාවන්ට සමාන වටිනාකමක් ඇති වැඩ සඳහා සමාන වැටුපක් ලබා දෙන බව සහතික කරයි.ඒ අනුව ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව වෙනස් කොට සැලකීමකින් තොරව ස්ථාපිත වේතන අනුපාතයක් පිළිබඳව එහි සඳහන් කරයි.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 1993 අප්‍රේල් 1 වන දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.

## අදාළ අභ්‍යන්තර නීති

1941 දරන පඩි පාලක සභා ආඥා පනත

1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (රැකියා හා පාරිශ්‍රමික රෙගුලාසි) පනත

2016 සේවකයන්ගේ ජාතික අවම වේතන පනත

## බලහත්කාරී ලෙස ශ්‍රමය ලබාගැනීම වැළැක්වීමේ ප්‍රඥප්තිය, අංක 105 (1957)

මෙම ප්‍රඥප්තියේ සඳහන් වන්නේ සාමාජික රටවල්, දේශපාලන බලහත්කාරකමක්, අධ්‍යාපනය හෝ ස්ථාපිත නියෝගයට පටහැනිව දේශපාලන අදහස් දැරීම හෝ ප්‍රකාශ කිරීම සඳහා දඬුවමක් ලෙස, ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රමය බල ගැන්වීමේ හා භාවිතා කිරීමේ ක්‍රමයක් ලෙස, ශ්‍රම විනය මාධ්‍යයක් ලෙස, වැඩ වර්ජනවලට සහභාගී වූවාට දඬුවමක් ලෙස සහ වාර්ගික, සමාජ, ජාතික හෝ ආගමික වෙනස්කම් කිරීමේ මාධ්‍යයක් ලෙස කිසිදු ආකාරයක බලහත්කාරයෙන් ලබා ගන්නා හෝ අනිවාර්ය ශ්‍රමයක් භාවිතා නොකිරීමට පියවර ගත යුතු බවයි.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 2003 ජනවාරි 07 දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.

## අදාළ අභ්‍යන්තර නීති

2015 දක්වා සංශෝධනය කරන ලද, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1885 දණ්ඩ නීති සංග්‍රහය සහ එහි සංශෝධන

1844 අංක 20 දරන වහල්භාවය අහෝසි කිරීමේ පනත

ශ්‍රී ලංකාවේ ජාතික විගමන ප්‍රතිපත්තිය

## රැකියාවන් සහ වෘත්තීය තත්ත්වයන් සම්බන්ධයෙන් පවතින වෙනස්කොට සැලකීම් පිටුදැකීම සම්බන්ධ ප්‍රඥප්තිය, අංක 111 (1958)

මෙම ප්‍රඥප්තියට අනුව සාමාජික රටවල, සේවා නියුක්තියන්ගේ ජාතිය හෝ වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, දේශපාලන මතය, ජාතිය හෝ සමාජ සම්භවය වැනි ඕනෑම පදනමක් මත සිදුවන වෙනස්කම් සහ බැහැර කිරීම් තහනම් කරන සහ සමාන අවස්ථාවන් ලබාදීමට යටත් නොවන නීති අවලංගු කරන නීති සම්මත කළ යුතු බවට නියම කරයි.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 1998 නොවැම්බර් 27 දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.



# අදාළ අභ්‍යන්තර නීති

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12, 12 (2), 17 වගන්ති

1939 මාතෘ ප්‍රතිලාභ ආඥාපනත

1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (රැකියා හා පාරිශ්‍රමික රෙගුලාසි) පනත

1988 අංක 3 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

1996 සමාජ ආරක්ෂණ මණ්ඩල පනත

1996 ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය

1995 දණ්ඩ නීති සංග්‍රහය සහ එහි සංශෝධන

කාන්තාවන්, තරුණ අය හා ළමුන් රැකියාවේ යෙදවීමේ පනත සහ එහි සංශෝධන

කාන්තා ප්‍රඥප්තිය (1993)

## වෘත්තීය තත්ත්වයන්ට එළැඹීම සඳහා වන අවම වයස සම්බන්ධ ප්‍රඥප්තිය, අංක 138 (1973)

ළමා ශ්‍රමිකත්වය ඵලදායි ලෙස අහෝසිකරණය සහතික කිරීමට සහ තරුණ තරුණියන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනයට ගැලපෙන මට්ටමකට සේවයට හෝ රැකියාවට ඇතුළත් වීමේ අවම වයස ඉහළ නැංවීමට සැලසුම් කරන ලද ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා සාමාජික රටවල් පෙලඹවීම මෙම ප්‍රඥප්තියේ අරමුණ විය. ප්‍රඥප්තියට අනුව අවම වයස අනිවාර්ය පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරන වයසට වඩා අඩු නොවිය යුතු අතර ඕනෑම අවස්ථාවක දී අවුරුදු 15 ට නොඅඩු විය යුතුය.

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 2000 පෙබරවාරි 11 වන දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.

## අදාළ අභ්‍යන්තර නීති

1956 අංක 47 දරන කාන්තාවන්, තරුණ අය හා ළමුන් රැකියාවේ යෙදවීමේ පනත

1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥා පනත

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත

1935 වෘත්තීය සමිති ආඥා පනත

1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥා පනත

1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (රැකියා හා පාරිශ්‍රමික රෙගුලාසි) පනත

# ළමා ශ්‍රමිකත්වයේ වඩාත්ම දරුණු මුහුණුවර වැලැක්වීමේ සහ ඒවා සම්බන්ධයෙන් ක්ෂණික පිළියම් යෙදීම සම්බන්ධ ප්‍රඥප්තිය, අංක 182 (1999)

මෙම ප්‍රඥප්තිට අනුව වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු දරුවෙක් ලෙස නිර්වචනය කර ඇති අතර හදිසි කාරණයක් ලෙස සලකා ළමා ශ්‍රමිකත්වයේ වඩාත්ම දරුණු මුහුණුවර වැලැක්වීමට සහ තුරන් කිරීමට සාමාජික රටවල් වහාම පියවර ගත යුතු බව සඳහන් කරයි. ප්‍රඥප්තියට අනුව, ළමයින් සේවයට යොදාගැනීම නුසුදුසු යැයි සඳහන් වන ආකාරයන් පහත දැක්වේ.

- ළමයින් විකිණීම හා ජාවාරම, ණය බන්ධනය සහ දාසත්වය වැනි වහල්භාවය හෝ වහල්භාවයට සමාන සියලු ආකාරයේ ක්‍රියාවන්; සහ සන්නද්ධ ගැටුම් සඳහා ළමයින් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් බඳවා ගැනීම ඇතුළුව බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් ශ්‍රමය ලබාගැනීම
- ගණිකා වෘත්තියට, අසභ්‍ය දේවල් හෝ අසභ්‍ය දර්ශන සඳහා ළමයින් භාවිතා කිරීම;
- නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා ළමයින් භාවිතා කිරීම, විශේෂයෙන් අදාළ ජාත්‍යන්තර ගිවිසුම්වල අර්ථ දක්වා ඇති පරිදි මත් ද්‍රව්‍ය නිෂ්පාදනය හා ජාවාරම සඳහා;
- එහි ස්වභාවය හෝ එය සිදු කරනු ලබන තත්වයන් අනුව දරුවන්ගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සදාචාරයට හානි කිරීමට ඉඩ ඇති වැඩ,

මෙම ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තිය 2001 මාර්තු 1 වන දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලදී.



# අදාළ අභ්‍යන්තර නීති

- 1956 කාන්තාවන්, තරුණ අය හා ළමුන් රැකියාවේ යෙදවීමේ පනත
- 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක (රැකියා හා පාරිශ්‍රමික රෙගුලාසි) පනත
- 2010 අනතුරු සහිත වෘත්තිය රෙගුලාසි.

# ආශ්‍රේය


1 https://www.un.org/ldcportal/new-european-union-report-on-the-effects-of-its-trade-schemes-on-promoting-development/

2 http://trade.ec.europa.eu/doclib/docs/2019/may/tradoc_157889.pdf

3 http://www.dailynews.lk/2018/08/20/business/160103/sl-suffers-rs-150-250-bn-loss-due-gsp-withdrawal

4 Sri Lanka's debt-ridden independence, www.ft.lk/dinesh-weerakkody/Sri-Lanka-s-debt--ridden-independence/5-672066

5 http://www.ft.lk/opinion/GSP-Plus-impact/14-661186

6 ibid



මෙම ප්‍රකාශනය ජර්මානු Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) කාර්යාලයේ අනුග්‍රහය සහිතව පළ කරන ලද්දකි. මෙහි අන්තර්ගතය පිළිබඳ පූර්ණ වගකීම ඩිමොක්‍රසි රිපෝර්ටින් ඉන්ටනැශනල් සතු වන අතර ඉන් ජර්මානු Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) කාර්යාලයේ දැක්ම නියෝජනය නොකෙරේ.

**ඡායාරූප හිමිකම්: වැලෙරි ලව්තුශෙන්කෝ / Shutterstock.com / maatram.org**

**DEMOCRACY REPORTING** INTERNATIONAL

## පිළිබඳ

ඩිමොක්‍රසි රිපෝටින් ඉන්ටනැශනල් (DRI) ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගයේ අතරමැද පවත්නා රටවල් වල පුරවැසියන්ගේ දේශපාලනික සහභාගීත්වය, රාජ්‍ය ආයතන වල වගවීම සහ ප්‍රජාතාන්ත්‍රික ආයතන වල සංවර්ධනය ප්‍රවර්ධනය කරයි. එය GSP+ පිළිබඳ කටයුතු කරන අතළොස්සක ජාත්‍යන්තර ක්‍රියාකාරකයින් පිරිසක් වශයෙන් GSP+ හි කොන්දේසි, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ළඟා කරගැනීම උදෙසා භාවිත කරයි. මෙම ව්‍යාපෘතිය GSP+ සහන ක්‍රමය හරහා පුළුල් ශ්‍රී ලාංකික කොටස්කරු සහභාගීත්වයක් ඇති කිරීම මගින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්ව ස්ථාපනය කිරීමටත් මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමට සන්සන්දනාත්මක ජාත්‍යන්තර අත්දැකීමක් ලබාදීමටත් උත්සාහ දරයි.


Democracy Reporting International gGmbH

Prinzessinnenstraße 30
10969 Berlin, Germany.
T / +49 30 27 87 73 00
F / +49 30 27 87 73 00-10
info@democracy-reporting.org

Democracy Reporting International

83A New Parliament Road, Pelawatte
Battaramulla, Sri Lanka.
T/ +94 112 787 662
srilanka@democracy-reporting.org
www.democracy-reporting.org